ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2015/10/30 |

## 2015 ඔක්තෝබර් මස උද්ධමනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ (කො.පා.මි.ද.) (2006/07=100) විචලනය මගින් මනිනු ලබන උද්ධමනය, 2015 ඔක්තෝම්බර් මාසයේ දී ලක්ෂ්‍යමය පදනම මත පසුගිය මාසයේ වාර්තා කළ සියයට -0.3 හි සිට සියයට 1.7 දක්වා ඉහළ ගියේය. මෙම ඉහළ යාම සඳහා, 2014 සැප්තැම්බර් මස සිට ක්‍රියාත්මක කරන ලද පරිපාලිත මිල ගණන් පහත හෙලමින් සිදුකළ සංශෝධනයන් මගින් සිදු වූ ඉහළ පදනම් බලපෑම ඉවත් වීම ප්‍රධාන වශයෙන් හේතු විය. ඔක්තෝම්බර් මාසයේ ලක්ෂ්‍යමය උද්ධමනය ඉහළ යාම සඳහා ආහාර කාණ්ඩයේ ප්‍රධාන අයිතමයන් කිහිපයක මිල ඉහළ යාම ද දායක විය. වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2015 සැප්තැම්බර් මාසයේ දී වාර්තා වූ සියයට 0.7 හිම නොවෙනස්ව පැවතිණි.

කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ විචලනය (2006/07=100)



කො.පා.මි.දර්ශකය 2015 සැප්තැම්බර් මාසයේ සිට ඔක්තෝම්බර් මාසය දක්වා සියයට 0.4 කින් ඉහළ ගියේය. මේ සඳහා ආහාර කාණ්ඩයෙහි අයිතමයන්හි මිල ගණන් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු විය. සහල්, මත්ස්‍ය වර්ග, කරවල, උම්බලකඩ, ඇතැම් පළතුරු වර්ග, බොහෝ එළවළු වර්ග, අර්තාපල්, රතුළූනු, අමු මිරිස්, වියළි මිරිස්, දෙහි සහ සීනි ආදියෙහි මිල ගණන් මෙම මාසය තුළ දී ඉහළ නැගිණි. කෙසේ වුවද, කුකුළු මස් , බිත්තර, පොල් සහ ගස්ලබු ආදියෙහි මිල ගණන් මෙම මාසය තුළ පහළ වැටිණි. ආහාර නොවන කාණ්ඩය තුළ, නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන උප කාණ්ඩයෙහි මිල ගණන් ඉහළ නැගිණි. රෙදිපිළි හා පාවහන් උප කාණ්ඩයෙහි මිල ගණන් මාසය තුළ දී පහළ වැටිණි. ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ ඒකක නඩත්තුව; සෞඛ්‍ය; ප්‍රවාහන; සන්නිවේදන; විනෝදාත්මක හා සංස්කෘතික; අධ්‍යාපන; සහ විවිධ භාණ්ඩ හා සේවා යන උප කාණ්ඩ මෙම මාසය තුළ නොවෙනස්ව පැවතිණි.